රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(I)

මගේ අංකය: EST-6/03/LEA/3381
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2021.04.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්

## රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම

කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීම සඳහා සෞඛ්‍ය අංශ විසින් නිකුත් කර ඇති උපදෙස් මාලාව සැලකිල්ලට ගෙන 2021.03.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021 හි විධිවිධාන නැවත දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලැබේ.

02. 2021.04.27 දින සිට සියලුම රාජ්‍ය ආයතනවල නිලධරයන්ට, ලිත් මසකට උපරිම වැඩ කරන දින 08ක් වන සේ සතියකට වැඩ කරන දින 02ක් නිලධරයන්ගේ නිවාඩුවලින් අඩු නොකර සේවයට වාර්තා නොකර සිටීමට ඉඩ දිය හැකි ය.

03. ඉහත පරිදි එක් ලිත් මසක් තුළ නිලධරයෙකුට ඔහුට හිමි ඔහුගේ සාමාන්‍ය නිවාඩු ලබා නොගෙන සේවයට වාර්තා නොකිරීමට ඉඩදිය හැකි උපරිම දින ගණන දින 08ක් ඉක්මවා නොයන පරිදි තම ආයතනයට වඩාත් ගැලපෙන ආකාරයට සේවයට වාර්තා කිරීමේ ක්‍රමවේදය සකස් කර ගැනීමට ආයතන ප්‍රධානීන්ට ඉඩකඩ පවතී.

04. දෛනික ජන ජීවිතය යථා පරිදි පවත්වා ගැනීමට අවශ්‍ය සේවා සැපයුම බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා නිලධරයන් සතියකට දින 03කට වඩා සේවයට කැඳවීමේ අවශ්‍යතාවක් පවතී නම් ඒ අනුව නිලධරයන් සේවයට කැඳවීම සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානියාට තීරණයක් ගත හැකි ය.

05. එලෙස මාසික සේවා මුර සැකසීමෙන් පසු නිලධරයෙකු සේවා මුර ක්‍රමය අනුව සේවයට වාර්තා කළ යුතු දිනයක සේවයට වාර්තා නොකළේ නම් පමණක් එම දිනය ඔහුගේ පෞද්ගලික නිවාඩුවලින් අඩු කිරීමට කටයුතු කළ යුතු ය.

06. සේවා මුර ක්‍රමයට අනුව සේවයට නොකැඳවූ දිනයක දී වුව ද සෑම රජයේ නිලධරයෙකුම මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාළ කාර්යයන්හි යෙදීමට සූදානම්ව සිටිය යුතු ය.

07. වෛද්‍ය හෝ වෙනත් හේතූන් මත මෙම සේවා මුර ක්‍රමයට ඇතුළත් කර නොගන්නා නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධයෙන් සාමාන්‍ය පරිදි කටයුතු කළ යුතු ය.

08. මෙලෙස සේවා මුර ක්‍රමයක් හඳුන්වා දීමේ අරමුණ සේවා ස්ථානයන්හි පුද්ගල දුරස්ථභාවය ආරක්ෂා කර ගැනීම හා වෛරසය පැතිරීම අවම කිරීම වන බැවින් එම අරමුණ මුල් තැන්හි තබා කටයුතු කළ යුතු අතර නිලධරයන්ගේ පහසුව හෝ කැමැත්ත ඉන් පසුව සැලකිල්ලට ගත යුතු ය.

09. යම් රජයේ නිලධරයකු පවතින තත්ත්වය තුළ නිරෝධායන රෙගුලාසි යටතේ නිරෝධායනයට යොමුකර ඇත්නම් හා එසේ නිරෝධායනය සඳහා යොමුකර ඇත්තේ රජයේ නිරෝධායන නීතිරීති උල්ලංඝනය කිරීම වෙනුවෙන් වන දඬුවමක් ලෙස නොවන්නේ නම් එවැනි නිලධරයන් සඳහා එම නිරෝධායන කාල සීමාව ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 12:9 උප වගන්තියෙහි විධිවිධාන පරිදි සම්පූර්ණ වැටුප් සහිත කාල සීමාවක් ලෙස සැලකිය යුතු ය.

10. කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා රජය විසින් දැනටමත් නිකුත් කර ඇති සෞඛ්‍ය උපදෙස් සහ ඉදිරියේ දී නිකුත් කරනු ලබන සෞඛ්‍ය උපදෙස් අනුව තම ආයතනයන්හි නිලධරයන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් පෞද්ගලික අවධානය යොමු කර කටයුතු කළ යුතු ය.

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

රාජ්‍ය සේවා, පළාත් සභා හා

පළාත් පාලන අමාත්‍යාංශය